දුරකථන /தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832 Fax: 2784825

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50 Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.

'இசுருபாய'
பத்தரமுல்ல.

"Isurupaya"
Battaramulla.

පාසල් කටයුතු හා පෞද්ගලික පාසල් ශාඛාව

ඔබේ අංකය / உமது இல. / Your No. } ....................

මගේ අංකය / எமது இல. / My No. } ED/01/12/10/11/01

දිනය / திகதி / Date } 2006.12.06

චක්‍රලේඛ අංක : 2006/45

පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාශ භාර නි/ස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම විදුහල්පතිවරුන් වෙත.

## සිසුන්ගේ පාසල් පැමිණීම ඉහළ නැංවීම සහ පාසල් කාලය තුළදී ගුරුභවතුන් විසින් මුදල් අයකරමින් පෞද්ගලික පංතිවල ඉගැන්වීම වැළැක්වීම

පාසල් අධ්‍යාපනය තුළින් සිසුන්ගේ සමස්ත පෞරුෂය ගොඩ නැංවීමේ අරමුණට පටහැනිව පාසල් වේලාව තුළ පාසලින් බැහැරව පවත්වනු ලබන අතිරේක පෞද්ගලික පංතිවලට පාසල් සිසුන් සහභාගී වන බවටත් රාජ්‍ය සේවය යටතේ පත්වීම් ලැබ රජයේ ගුරුවරුන් වශයෙන් සේවයේ යෙදී සිටින ඇතැම් ගුරුභවතුන් පාසල් කාලය තුළ දී තමනට පැවරී ඇති රාජකාරි කටයුතු කෙරෙහි අවධානයක් යොමු නොකොට මුදල් අය කරමින් පෞද්ගලික ආධාරක පංති පවත්වාගෙන යන බවටත්, පැමිණිලි රාශියක් මෙම අමාත්‍යාංශය වෙත වාර්තා වී ඇත. එසේම මෙම පැමිණිලි පිළිබඳ සොයා බැලීමේදී ඒවා සත්‍ය බවටද තහවුරු වී ඇත.

02. රජයේ පාසල්වල අ.පො.ස.(උසස් පෙළ) ඉගෙනුම ලබන දෙවසරක කාලය තුළදී ඔවුනට නියමිත විෂය නිර්දේශයන් ආවරණය කිරීම සඳහාත් එයට අදාළව සිදුකළ යුතු පාසල් පාදක ක්‍රියාකාරකම් නිසි පරිදි සිදුකරලීම සඳහාත් 12 සහ 13 ශ්‍රේණිවල ඉගෙනුම ලබන සිසුන් ක්‍රමවත්ව පාසලට පැමිණීම අත්‍යවශ්‍ය වේ. තවද පාසල් මට්ටමින් විෂය නිර්දේශයට අනුකූලව ප්‍රතිකාර්ය ඉගැන්වීම් ආදිය සංවිධානය කිරීමටත් මෙය ආධාරකයක් වනු ඇත. එහෙත් සමහර සිසුන්ගේ පැමිණීම දුර්වල මට්ටමක පැවතීම නිසා එය ඉහළ නැංවීමට පහත සඳහන් ක්‍රියාමාර්ග ගත යුතුය.

i. අ.පො.ස (උසස් පෙළ) විභාගයට පෙනී සිටීම සඳහා අධ්‍යාපනය ලබන සෑම පාසල් සිසුවෙකුම විභාගය සඳහා අයදුම් පත්‍ර ඉදිරිපත් කරන අවස්ථාව වන විට පාසල් පැවැත්වූ දින ගණනින් අවම වශයෙන් 80 % ක පැමිණීම තහවුරු කර තිබිය යුතු අතර එම අවශ්‍යතාවය සම්පූර්ණ කර නොමැති සිසුන් විභාගය සඳහා ඉදිරිපත් නොකිරීමට විදුහල්පතිවරුන් විසින් කටයුතු කළ යුතු බව අවධාරණය කරමි.

ii. කෙසේ වුවද පැමිණීමේ ප්‍රතිශතය 80 % නොමැති මෙවන් සිසුන් විසින් හෝ ඔවුන් ගේ දෙමාපියන් විසින් විභාගයට පෙනී සිටීම සඳහා ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් පාසල විසින් පරීක්ෂා කර බැලිය යුතුය. පරීක්ෂා කිරීමේදී අදාල පංති භාර ගුරුභවතා හා අදාල අංශ භාර ප්‍රධානීන්ගේ අදහස් ද සැලකිල්ලට ගනිමින් පාසල් කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශයන්ට අනුව විදුහල්පති විසින් තීරණය ගත යුතුය. පාසලට නොපැමිණීම හා ඉගෙනුම් කටයුතුවලට සහභාගීනොවීමට බලපාන රෝගී තත්ත්වයන් හෝ වෙනත් සාධාරණ හේතුවක් බව පෙනී යන්නේ නම් පමණක් ඒ බව සනාථ කරගෙන එවන් සිසුන් විභාගය සඳහා ඉදිරිපත් කිරීම පිළිබඳ අවසන් තීරණය ගැනීමට විද්‍යාලයීය කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශය මත විදුහල්පතිට හැකියාවක් ඇත. එවැනි තීරණ පැහැදිලි ලෙස ලිඛිතව සටහන් කර තැබීම අත්‍යාවශ්‍ය වන අතර කිසිවිටකත් එවන් ඉල්ලීම් මෙම අමාත්‍යාංශය වෙත හෝ අනෙකුත් අධ්‍යාපන බලධාරීන් වෙත යොමු නොකරන ලෙස ද අවධාරණය කරමි.

iii. ඉදිරියේදී අ.පො.ස. (උසස් පෙළ) පංති සඳහා සිසුන් ඇතුලත් කර ගැනීමේදී එම විභාගයට ඉදිරිපත්වීම සඳහා අවම වශයෙන් 80 % ක පැමිණීමේ අවශ්‍යතාවය හා 12, 13 ශ්‍රේණි සඳහා නියමිත ඇගයීම් සම්පූර්ණ කළයුතු බවත් මෙම අවශ්‍යතාවයන් සම්පූර්ණ නොකරන සිසුන් විභාගය සඳහා ඉදිරිපත් නොකරන ලෙසත් විදුහල්පති විසින් අදාල සිසුන් හා දෙමව්පියන් දැනුවත් කරන ලෙසද වැඩිදුරටත් අවධාරණය කරමි.

03. කෙසේවුවද සිසුන්ගේ පාසල් පැමිණීමේ උනන්දුව රඳා පවතින්නේ තමන් ඉගෙනීම ලබන විෂයයන්ට අදාල විෂය කරුණු නිසි පරිදි ආවරණය කිරීමත් ප්‍රතිකාර්ය ඉගැන්වීම් වැඩසටහන් මෙහෙයවීමත් මත වන බැවින් ගුරුවරුන්ගේ උනන්දුව සෘජුවම ශිෂ්‍ය සහභාගීත්වය කෙරෙහි බලපානු ලැබේ.

04. අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් මෙන්ම ගුරුවරුන් සඳහා සලසා ඇති ඉහල වැටුප් තලයන් ද ලබා දී ඇති තත්ත්වයන් තුළදී පාසල තුළ තමනට පැවරී ඇති කාර්යයන් නිසි පරිදි ඉටු කරනු වෙනුවට පාසල් කාල වේලාව තුළදීම මුදල් අය කරමින් පෞද්ගලික ආධාරක පංති පැවැත්වීමට පෙලඹී තිබීම කණගාටුවට කරුණකි. මෙවැනි ගුරුවරුන් තමා ද නිදහස් අධ්‍යාපනය මගින් මෙම තනතුරු ලැබුවෙකු බව අමතක කරමින් කටයුතු කිරීම ඛේදජනකය.

05. කෙසේ වුවද රාජ්‍ය සේවයේ ගුරු පත්වීමක් ලැබ සේවය කරනු ලබන ගුරුවරු තමා උගන්වන විෂයයට අදාල විෂය නිර්දේශය අදාල වසර තුළදී සම්පූර්ණ කිරීමට බැඳී සිටිති. එම කාර්යය ඉටු කිරීමේදී තමා වෙතින් අධ්‍යාපනය ලබන සෑම සිසුවෙකුගේම හැකියා හා අවශ්‍යතාවයන් හඳුනාගෙන ඒ අනුව ඉගැන්වීමේ කාර්යයන් ඉටු කිරීම අවශ්‍ය වේ. එහෙත් මෙහිදී තම විෂයමාලාව නිසි පරිදි සම්පූර්ණ කිරීම හා පාසලේ තමාට පැවරී ඇති රාජකාරි ඉටු කිරීම වෙනුවට පාසල් කාල වේලාව තුළදී මෙන්ම ඉන් පරිබාහිරව තම පාසලේම සිසුන් හා වෙනත් සිසුන් උදෙසා පෞද්ගලික පංති පැවැත්වීමට කටයුතු කිරීම මගින් පාසල තුළදී අදාල විෂය නිර්දේශ සම්පූර්ණ කිරීමට නොහැකිවීම අධ්‍යාපන පද්ධතියට හානිදායක අන්දමින් බලපා ඇති අතර පාසල් සිසුන් සැලකිය යුතු සංඛ්‍යාවක් පාසල් අධ්‍යාපනයෙන් ගිලිහීයාමට ද එය බොහෝදුරට බලපා ඇත. ඒ අනුව රජය මගින් අධ්‍යාපනය සඳහා දරණ වියදම අපතේ යාමක් සිදුවේ. එබැවින් පහත සඳහන් කරුණු කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

i. සිසුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා රජයෙන් පහසුකම් සලසා දී තිබියදීත් පාසල් කාලය තුළදී කිසියම් විෂයයක් සඳහා පාසල් සිසුන්ගෙන් මුදල් අයකර ඉගැන්වීම් සිදුකිරීම නිදහස් අධ්‍යාපනයේ අරමුණට පටහැනි වන බැවින් එසේ ක්‍රියා කරන්නේ නම් වහාම එම ක්‍රියාමාර්ග නතර කළයුතුය.

ii. පාසල් කාලය තුළ නියමිත කාල සටහනට අනුව ඉගැන්වීමේදී මානව සම්පත් නොමැති අවස්ථාවකදී පමණක් පාසල් සංවර්ධන සමිතියෙන් සම්මත කරගෙන පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ ලිඛිත අවසරය මත කොන්ත්‍රාත් පදනමින් ගුරුවරු සීමිත කාලයකට යොදා ගත හැකිය. එවැනි අවස්ථාවලදී පාසල් සිසුන්ගෙන් මුදල් අය නොකර පාසල් සංවර්ධන සමිතිය මගින් හෝ පහසුකම් හා සේවා ගාස්තු මගින් එම ගුරුවරුන් සඳහා ගෙවීම් කළ යුතුය.

iii. විදුහල තුළ යම් කිසි විෂයයක් ඉගැන්වීම සඳහා ගුරුභවතුන් නොමැති විටකදී අදාල විෂයයන් සඳහා අවශ්‍ය වන ගුරුභවතුන් ලබා ගැනීමට පළාත් පාසලක් නම් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ දැනුවත් කිරීමට කටයුතු කළ යුතු අතර ජාතික පාසලක් නම් ජාතික පාසල් අධ්‍යක්ෂ දැනුවත් කර අවශ්‍ය ගුරුභවතුන් ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ.

iv. රාජ්‍ය සේවයේ ගුරු පත්වීමක් ලැබ පාසල්වල සේවය කරනු ලබන ගුරුභවතුන් නියමිත රාජකාරි කාලසීමාවේදී පාසල තුළ හෝ පාසලින් පිටත මුදල් අයකර පෞද්ගලික ඉගැන්වීම් කටයුතුවල නිරතවීමට කිසිදු හැකියාවක් නොමැත.

06. ඉහත 5 වගන්තියේ i හා iv උප වගන්තිවල සඳහන් කරුණු අනුව රජයේ ගුරුභවතුන්හට අධ්‍යාපන අමාත්‍යාංශයේ අදාල චක්‍රලේඛ උල්ලංඝනය කිරීම හා ආයතන සංග්‍රහයේ XXX පරිච්ඡේදයේ 1 වගන්තියේ සඳහන් කරුණු උල්ලංඝනය කිරීම වෙනුවෙන් විනයානුකූලව කටයුතු කරන බව අවධාරණය කරමි.

07. එසේම මේ අන්දමින් පාසල් කාලය තුළ නිවාඩු නොලබා නොපැමිණ ඇති සහ පාසල් කාලය තුළ පෞද්ගලික පන්තිවල උගන්වන ගුරුවරුන් පිළිබඳව සොයා බලා අවශ්‍ය පියවර ගැනීමට අමාත්‍යාංශයේ විශේෂ ඒකකයක් පිහිටුවා ඇති බවත් දැනටමත් අමාත්‍යාංශයට ලැබී ඇති තොරතුරු අනුව එවැනි ගුරුවරුන් හඳුනා ගැනීම අපහසු නොවන බවත් පැහැදිලි කර දිය යුතුය.

08. තවද පාසල් කාලය තුළදී විධිමත් ලෙස හා පිළිගත හැකි හේතු මත නිවාඩු ලබා ගෙන හෝ නොගෙන ගුරුවරුන් එසේ ක්‍රියා කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් විදුහල්පතිවරයාද වගකිව යුතුවේ. එවැනි අවස්ථාවන් සනාථ වුවහොත් විදුහල්පතිවරුන්ටද විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ඇත.

09. පාසල් කාලය තුළ මුදල් අයකරමින් ඉගැන්වීම් කටයුතු සංවිධානය කිරීම වැළැක්වීමේ අරමුණින් නිකුත් කරනු ලැබ ඇති 2005.05.10 දිනැති 2005/18 දරණ චක්‍රලේඛය අභිබවා මෙම චක්‍රලේඛය බල පැවැත්වෙන බව අවධාරණය කරමි.

ආරියරත්න හේවගේ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය